# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 1350 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 759 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

## 01. මාරක රිය අනතුරක් - දොම්පේ පොලිස් වසම.

2025.04.17 අද දින අළුයම් කාලයේ දොම්පේ පොලිස් වසමේ ගලකොන - ගුරුවල මාර්ගයේ ගුරුවල ප්‍රදේශයේදී ගුරුවල දෙස සිට ගලකොන හන්දිය දෙසට ගමන් ගත් යතුරු පැදියක් පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි කණුවක ගැටි අනතුරක් සිදුව ඇත.

අනතුරින් පැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා දොම්පේ රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ පාළුගම, දොම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දොම්පේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අවුරුදු උත්සවයක් සඳහා සුදානම් කරමින් සිටි ලිස්සන ගහෙන් ඇද වැටි දරුවෙකු මියයාම - පිටිගල පොලිස් වසම.

2025.04.16 වන දින රාත්‍රී කාලයේ පිටිගල පොලිස් වසමේ අමුගොඩ ප්‍රදේශයේ ක්‍රීඩා පිටියක පැවැත්වීමට නියමිතව තිබූ අවුරුදු උත්සවයක පිරිසක් ලිස්සන ගහ සුදානම් කරමින් සිටියදී දරුවෙකු එම ලිස්සන ගසේ ඉහලට නැගීමේදී ඉන් ඇද වැටි තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ දෙනියවත්ත, අමුගොඩ ප්‍රදේශයේ පදිංචි දරුවෙකු වේ.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර 2025.04.17 වන අද දින පශ්චාත් මරණ පරික්ෂණය පැවැත්වීමට නියමිතය. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**